- ගුප්ත රජවාසලේ නවරත්න කවීන් සේවය කළේය.
- ආගමික වශයෙන් ඇති වූ ප්‍රබෝධය. හින්දු ආගමේ පුනර්ජීවනයක් ඇති විය. එහිදී වෛදික ග්‍රන්ථ මුල් කරගෙන තිබූ බ්‍රාහ්මණ ආගම නව ස්වරූපයක් ලබමින් වර්තමානයේ හඳුන්වන හින්දු ආගම සකස් වීම.
- බෞද්ධ හා ජෛන දර්ශනවාද දියුණුවීම. මහායානික බුදුදහමේ මාධ්‍යමික හා යෝගාචරවාද ක්‍රමවත්වීම. ජෛනාගමේ ශ්වේතම්බර හා දිගම්බර යන නිකාය දෙක ස්ථිර පදනමක් මත හැඩගැසීම.
- මෙකල නව නිර්මාණ හැර පැරණි ග්‍රන්ථ ද නව මුහුණුවරකින් රචනා විය. මහාභාරතය, රාමායණය වර්තමානයේ පවතින තත්ත්වයට සකස් විය. මනුස්මෘතිය හා පුරාණ ග්‍රන්ථ ද මෙලෙස සකස් විය. පංචතන්ත්‍රය හා හිතෝපදේශ මේ අවධියේදී සම්පාදනය විය.
- සාහිත්‍යයේ මෙන්ම ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති, කැටයම් හා චිත්‍ර කලාවේ දියුණුවක් ඇතිවීම.
  - ගෘහ නිර්මාණ ශිල්පය
    - බුද්ධ හා දේව ප්‍රතිමා උදෙසා ගොඩනැගිලි ඉදිකිරීම.
    - එහිදී ගඩොල් හා ඔපමට්ටම් කළ කළුගල් යොදා ගැනීම.
    - විවිධ ස්වරූපයේ විහාර හා දේවාල ඉදිකිරීම.
      සාංචි අංක 17 විහාරය,
      නච්නා කුඨාරාහි පාර්වති කෝවිල,
      භූටාරහි ශිව කෝවිල,
      දියෝගාර්හි දශාවතාර කෝවිල,
  - මූර්ති හා කැටයම් ශිල්පය.
    - මූර්ති කලාව මුළුමනින්ම විදේශ ආභාසයෙන් මිදීම.
    - බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ සකලාංග සම්පූර්ණවීම.
    - සාරානාත්හි හිඳි පිළිමය මූර්ති කලාවේ අති විශිෂ්ට නිර්මාණයකි.
    - විෂ්ණු, ශිව යන බ්‍රාහ්මණ ආගමික දේව රූප සකස්වීම.
    - ප්‍රධාන මූර්ති නිර්මාණ මධ්‍යස්ථාන පාඨලිපුත්‍ර, සාරානාත් හා මථුරා ය.
    - ප්‍රතිමාකරණයේදී කළුගල්, පිලිස්සු මැටි පමණක් නොව මෙකල ලෝහ ද භාවිතා කිරීම. (නාලන්දාවේ ඇති ලෝකඩයෙන් නිම වූ මීටර් 25ක් උස බුද්ධ ප්‍රතිමාව, සුල්තාන්ගන්ජ්හි තඹයෙන් නිම වූ බුදුපිළිමය)
  - කැටයම්
    - උදයගිරි ලෙන්හි ඇති වරාහාවතාර කැටයම,
  - චිත්‍ර ශිල්පය
    - චිත්‍ර ශිල්පය උච්චස්ථානයට පත්වීම.
    - අජන්තාහි i, ii, xvi, xix ලෙන්හි චිත්‍ර,
    - බාඝ්හි ලෙන්හි චිත්‍ර,
    - බදාමියේ අංක 3 ගුහාවේ ඇති ශිව පාර්වති දර්ශනය,
- ගුප්ත යුගයේදී විවිධ ක්ෂේත්‍රයන්හි ඇති වූ දියුණුව නිසා ඉන්දියානු සංස්කෘතියේ ස්වර්ණමය යුගය බවට ගුප්ත යුගය පත් විම.

***(ලකුණු 14යි)***

Department of Examinations

